# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1430/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 15/11/2023<br>පැය 2355 |

## මාධ්‍ය නිවේදනය

**වෙඩි වැදීමක් හේතුවෙන් පුද්ගලයෙකු මියයාමක් - ලුණුගම්වෙහෙර පොලිස් වසම.**

2023.11.15 වන දින රාත්‍රි කාලයේදී වෙඩි වැදීමකින් බරපතල තුවාල සහිතව ලුණුගම්වෙහෙර රෝහල වෙත ඇතුලත් කළ පුද්ගලයෙකු මියගොස් ඇති බවට ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වන වම් ඉවුර, තිස්සමහාරාමය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කතරගම කරවිල වනජීවී කාර්යාලයේ නිලධාරීන් පිරිසක් විසින් ඔවුන්ට අයත් රක්ෂිත කලාපයේ වැටලීමක් සිදුකරන අතරතුරදී, පුද්ගලයින් පිරිසක් පලා ගිය බවට අනෙකුත් අවට වනජීවී කාර්යාල දැනුවත් කිරීමෙන් පසු යාල වනෝද්‍යානයේ කලාප අංක 06 වම් ඉවුර කලාපයේදී පලා ගිය පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහා සිදුකළ සෝදිසි මෙහෙයුම අතුරතුරදී මෙම වෙඩි තැබීම සිදුව ඇති බවට පොලිසිය කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෙම වෙඩි තැබීම සිදුකරන ලද වන සත්ව නියාමකවරයෙකු වෙඩි තැබීම සිදුකළ ගිනි අවිය සමඟ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත. ලුණුගම්වෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**